(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 2(11).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2023 ඔක්තෝබර් 20 සිකුරාදා**

**2023 නොවැම්බර් 07 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

මුදල් පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ජාතික ජලශාස්ත්‍රීය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 241 — වැඩසටහන 01 — † 2023 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබාගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් දෙසිය තිස් එක් බිලියන පන්සිය මිලියනයක් (රු. 231,500,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළයුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

**උපලේඛනය**

| | | | |
|---|---|---|---|
| **ශීර්ෂය 241** | **-** | **රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව** | |
| **වැඩසටහන 01 -** | | **මෙහෙයුම් වැඩසටහන** | |
| | | මූලධන වියදම් | රු. 231,500,000,000 |
| | | **මුළු වියදම** | **රු. 231,500,000,000** |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2023 ඔක්තෝබර් 17 දින ඉදිරිපත් කරන ලද 2023 අංක 01 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

*

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා සහ වාරිමාර්ග අමාත්‍යතුමා,— ක්‍රීඩා පනත යටතේ නියෝග (අංක 1),— 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වගන්තිය සමඟ කියවිය යුතු 41 වගන්තිය යටතේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග ඇතුළත් 2022 මැයි 27 දිනැති අංක 2281/37 දරන අති විශේෂ ගැසට් නිවේදනය අවලංගු කරමින් 2022 සැප්තැම්බර් 08 දිනැති අංක 2296/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.10.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා සහ වාරිමාර්ග අමාත්‍යතුමා,— ක්‍රීඩා පනත යටතේ නියෝග (අංක 2),— 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වගන්තිය සමඟ කියවිය යුතු 41 වගන්තිය යටතේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 නොවැම්බර් 05 දිනැති අංක 2304/88 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.10.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා සහ වාරිමාර්ග අමාත්‍යතුමා,— ක්‍රීඩා පනත යටතේ නියෝග (අංක 3),— 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වගන්තිය සමඟ කියවිය යුතු 41 වගන්තිය යටතේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.10.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා සහ වාරිමාර්ග අමාත්‍යතුමා,— ක්‍රීඩා පනත යටතේ නියෝග (අංක 4),— 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 18 සහ 19 වගන්ති සමඟ කියවිය යුතු 41 වගන්තිය යටතේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.10.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2023 නොවැම්බර් 07 අඟහරුවාදා)**

2857/2023

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ පාලිත සමාගම් සහ අනුබද්ධ ආයතන කවරේද;

(ii) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සඳහා අනුමත කාර්ය මණ්ඩලය කොපමණද;

(iii) එම කාර්ය මණ්ඩලයේ විධායක හා කණිෂ්ඨ සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) විධායක හා කණිෂ්ඨ කාර්ය මණ්ඩලවල එක් එක් තනතුරට අදාළ මාසික වැටුප් හා දීමනා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ එක් එක් සේවකයා සහ ඔහුගේ කුටුම්භය වෙනුවෙන් ලබා දී ඇති රක්ෂණ හිමිකමේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3678/2023

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 1997.01.01 දින සිට 2019.12.31 දින දක්වා විශ්‍රාම ගන්වන ලද;

(ii) 2020.01.01 දින සිට 2020.12.31 දින දක්වා විශ්‍රාම ගන්වන ලද;

(iii) 2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා විශ්‍රාම ගන්වන ලද;

(iv) 1997.01.01 දින සිට 2021.12.31 දින දක්වා විශ්‍රාම ගන්වන ලදුව 2021.12.31 දින වනවිට මරණයට පත් වී ඇති;

ශ්‍රී ලංකා විදුහල්පති සේවය, ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවය සහ ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන් සංඛ්‍යාව එක් එක් සේවය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 1997.01.01 දින සිට 2021.12.31 දින දක්වා කාලය තුළ වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප ලබා ගන්නා ලද පුද්ගලයන් සංඛ්‍යාව ඉහත සඳහන් එක් එක් සේවය සහ එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේනම්, ඒ මන්ද?